# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,143 - 2019 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1680 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1693 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1711 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ඔක්තෝබර් මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ඔක්තෝබර් මස 4 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *බඳවා ගන්නා අවම අධ්‍යාපන සුදුසුකම්/ අමතර සුදුසුකම්* |
|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 02 | PLI- 2016 Grade III<br>රු.24,250-250x10-270x 10-300 x 10-330 x 12-<br>රු. 36,410/- | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම |
| ආයුර්වේද ඖෂධ සංයෝජක | 02 | PL2- 2016 Grade III<br>රු. 25,250- 270 x10-300 x 10-330 x 10-350 x 12-<br>රු. 38,450/- | i. අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය.<br>ii. අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හෝ අංක i සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට අනුව බඳවා ගැනීමට හා එසේ බඳවා ගැනීමෙන් අනතුරුව එම තනතුරට අදාළව වක්වැල්ල කළමණාකරණ හා පුහුණු ආයතනය විසින් පවත්වනු ලබන ත්‍රෙමාසික පුහුණු පාඨමාලාවක් හදාරා, අදාළ සහතික පත්‍රය ලබා ගැනීම. (මෙම සහතිකය තුන් අවුරුදු පරිවාස කාලය තුළ ලබා ගැනීම අනිවාර්ය වේ).<br>iii. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

02. *වයස් සීමාව* :-

i. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුයි. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

03. *පොදු සුදුසුකම්* :

i. අයදුම්කරු පරම්පරාවෙන් හා ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.

ii. අයදුම්කරුවන් දකුණු පළාත් සභා සීමාව තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතික මත අදාළ ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය. කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

iii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා පත්කර ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂාවේදී ශාරීරික වශයෙන් නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

iv. දණ්ඩ නීති සංග්‍රහයේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

v. අයදුම්කරුවන්ට අදාළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් තිබිය යුතුය.

04. *පොදු කොන්දේසි :-*

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

ii. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේදී ශාරීරික වශයෙන් නුසුදුස්සෙක් බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන තීරණයන්ට යටත් විය යුතුය. වැන්දඹු/ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පමණක් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ.

06. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලටද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලටද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය:-*

i. සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

ii. (අ) වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | අමතර සුදුසුකම් | 10 | |
| 3 | සේවයට අදාළ පළපුරුද්ද | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 5 බැගින්) | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

(ආ) ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | වෘත්තීය සුදුසුකම් | 10 | |
| 3 | පළපුරුද්ද | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 5 බැගින්) | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

සටහන: 1. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කෙරේ.

2. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත පරීක්ෂණයේදී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

08. අයදුම්පත්‍රයේ තමන් ඉල්ලුම් කරන අදාල තනතුර දැක්විය යුතු අතර පහත සඳහන් ලියකියවිලි වල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත
iii. අධ්‍යාපන සහතික/ශිෂ්‍ය කාර්ය දර්ශකය
iv. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රදේශයේ පදිංචි බවට ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය අදාල ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව මාස 06ක් තුළදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකය)
v. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
vi. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ ලබාගත් සහතික (තිබේ නම්)
vii. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2019 ඔක්තෝබර් 15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ සභාපති, කරන්දෙණිය ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතුය. ( A 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය.) අසම්පූර්ණ, අපැහැදිළි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව,

2019ක් වූ සැප්තැම්බර් මස 09 වන දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

***.............................................. (ඖෂධ සංයෝජක/වැඩ ක්ෂේත්‍ර කම්කරු)***
***තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. සම්පූර්ණ නම :- ..........................................................................................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :- ............................................................................................................
3. ස්ථිර පදිංචි ලිපිනය :- ................................................................................................................................
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ...........................................................................................................................
5. උපන් දිනය :- අවුරුද්ද : .......................................... මාසය : ....................................... දිනය : .....................................
6. ජාතික හැඳුනුම්පත් අංකය :- ...............................................................
7. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ......................................................................
8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-

   අවුරුදු : ......................................... මාස : ....................................... දින : ....................................
9. විවාහක/අවිවාහක බව : - .............................................................
10. ජාතිය : - ............................................................

11. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද ? ලියාපදිංචියෙන් ද යන වග : - ............................................................

12. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර)

සමත් වූ වසර/ ශ්‍රේණිය : - ............................................................

අ. පො. ස. (සා/පෙළ) විභාගය :

විභාග අංකය : - ............................................................

විභාග වර්ෂය : - ............................................................

සමත් වූ විෂයන් : - ............................................................

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. වෘත්තීය සුදුසුකම් හා අමතර සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) :- ..................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

14. සේවා පළපුරුද්ද :- ..........................................................................................................................................

. ...........................................................................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? ඔව්/නැත

ඔව් නම් එයට අදාළ තොරතුරු :- ..........................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට සනාථ වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

. .....................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :....................................

09-853

## කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වැඩ/ ක්ෂේත්‍ර කම්කරු III පුරප්පාඩු පිරවීම

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති වැඩ / ක්ෂේත්‍ර කම්කරු III තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2019.10.11 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 04 | PL 1 - 2016 රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - 36,410 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබිය යුතුය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි* .-

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(2) මානසික යෝග්‍යතාවයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.
අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(3) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බලනොපානු ඇත.)

(4) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* .-

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(2) පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය .-

(1) උප්පැන්න සහතිකය;

(2) අධ්‍යාපන සහතික;

(3) අදාළ කාල සීමාව සඳහා පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය;

(4) මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක්;

(5) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;

(6) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික.

05. *අයදුම් කළ යුතු ආකාරය .-*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2019.10.11 වැනි දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.

(4) අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැලකිය යුතුයි .-** මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. චාන්දනී ඒකනායක,
ලේකම්,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 17 වැනි දින,
ගොතටුව මුල්ලේරියාව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ......................................... තනතුර සඳහා අයදුම්පත*

01. (අ) මුලකුරු සමග නම :————————————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.

02. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.

(ආ) ස්ථිර පදිංචි ලිපිනය :————————————.

03. දුරකථන අංකය : පෞද්ගලික :————————————. නිවස :————————————

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.

05. (අ) උපන් දිනය : වර්ෂය ——————. මාසය ——————. දිනය ——————.

(ආ) අයදුම්පත් භාරගන්නා 2019.10.11 දිනට වයස : අවුරුදු:——————. මාස:——————. දින:——————.

06. ජාතික හැඳුනුම්පත් අංකය:————————————.

07. විවාහක/අවිවාහක තත්වය :————————————.

08. අධ්‍යාපන සුදුසුකම්:————————————.

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය :————————————.

8.2 අ.පො.ස. (සා.පෙළ) :

I. වර්ෂය :————————————. මාසය :————————————.

II. විභාග අංකය :————————————.

III. ප්‍රතිඵල :————————————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස. (උසස් පෙළ) :

I. වර්ෂය :——————————. මාසය :——————————.

II. විභාග අංකය :——————————.

III. ප්‍රතිඵල :——————————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

09. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :——————————.

වෙනත් සුදුසුකම් : ——————————.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?/නැත්ද? යන වග :——————————

11. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :

(අ) දැනට දරන තනතුර :——————————.

(ආ) එම තනතුරට පත් වූ දිනය :——————————.

(ඇ) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/ව්‍යාපෘති යන වග) : ——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

**(රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)**

මෙම අයදුම්කරු වන .......................................................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ........................................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක. /නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි. / නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය :——————————.

09-999/1

## කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් III පුරප්පාඩු පිරවීම

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති මෝටර් රථ රියදුරන් III තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2019.10.11 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | මෝටර් රථ රියදුරන් III ශ්‍රේණිය | 01 | PL 3 - 2016 රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990<br><br>(3 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව, ඇතුළුව විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්වීම අනිවාර්ය වේ.)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>1. පෞද්ගලික / කුලීරථ සහ තාර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම හා රිය පැදවීම පිළිබඳ මනා නිපුණතාවක් තිබිය යුතුය.<br><br>(බඳවා ගන්නා දිනට වසර තුනකට (03) පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලත්‍රයක් ලබා තිබිය යුතුය.) බලපත්‍ර ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br><br>3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුමක් තිබිය යුතුය.<br><br>*කායික සුදුසුකම් :*<br><br>1. අවම උස අඩි පහක් (5') විය යුතුය.<br><br>2. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි* .-

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(2) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

(3) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(4) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බලනොපානු ඇත.)

(5) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා වෘත්තීය පරීක්ෂණයන් මඟින් සුදුස්සන් තෝරනු ලැබේ.

03. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි* .-

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

(2) පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය .-

(1) උප්පැන්න සහතිකය

(2) අධ්‍යාපන සහතික

(3) පදිංචිය සනාථ කිරීමේ සහතිකය

(4) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය

(5) මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක්

(6) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික

(7) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

05. *අයදුම් කළ යුතු ආකාරය* .-

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) සකස් කරගත් අයදුම්පතක් 2019.10.11 වැනි දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කළ යුතුය.

(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.

(4) අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැලකිය යුතුයි* .- මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. චාන්දනී ඒකනායක,
ලේකම්,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 17 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

**කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ......................................... තනතුර සඳහා අයදුම්පත.*

01. (අ) මුලකුරු සමග නම :————————————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.

02. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.

(ආ) ස්ථිර පදිංචි ලිපිනය :————————————.

03. දුරකථන අංකය : පෞද්ගලික :————————————. නිවස :————————————

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.

05. (අ) උපන් දිනය : වර්ෂය ————. මාසය ————. දිනය ————.

(ආ) අයදුම්පත් භාර ගන්නා 2019.10.11 දිනට වයස : අවුරුදු: [ ] මාස: [ ] දින: [ ]

06. ජාතික හැඳුනුම්පත් අංකය:————————————.

07. විවාහක/අවිවාහක තත්ත්වය :————————————.

08. අධ්‍යාපන සුදුසුකම්:————————————.

8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පන්තිය :————————————.

8.2 අ.පො.ස. (සා.පෙළ) :

I. වර්ෂය :————————————. මාසය :————————————.

II. විභාග අංකය :————————————.

III. ප්‍රතිඵල :————————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.3 අ.පො.ස. (උසස් පෙළ) :

I. වර්ෂය :————————————. මාසය :————————————.

II. විභාග අංකය :————————————.

III. ප්‍රතිඵල :————————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

09. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :————————————.

වෙනත් සුදුසුකම් : ————————————.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?/නැත්ද? යන වග :————————

11. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :
(අ) දැනට දරන තනතුර :————————.
(ආ) එම තනතුරට පත් වූ දිනය :————————.
(ඇ) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/ව්‍යාපෘති යන වග) : ————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————————;
අයදුම්කරුගේ අත්සන

දිනය :————————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

**(රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)**

මෙම අයදුම්කරු වන .................................................................................................. මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .........................................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක. /නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි. / නොකරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————.
පදවි නාමය :————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————————
(නිල මුද්‍රාව යොදන්න)
දිනය :————————.

09-999/2

---

## කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය කම්කරු III පුරප්පාඩු පිරවීම

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති සෞඛ්‍ය කම්කරු III තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2019.10.11 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 02 | PL 1 - 2016 රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x300 - රු. 36,410 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් ව තිබිය යුතුය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි .-*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(2) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

